පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: **492**

ආයුර්වේද දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක **119(4)** යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

ආයුර්වේද දෙපාර්තමේන්තුව

මූල්‍ය නීතිරීති හා කාර්යය සාධනය පිළිබඳ නියමයන් සඳහා අනුගත වීමේ ප්‍රගතිය

පළමු කොටස . 91

	භදුනාගත් දුර්වලතා	වර්තමානයේ ප්‍රගතිය
01.	2022.12.13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ 8.1හා 8.2 ඡේද ප්‍රකාරව සිගාස් වැඩසටහනේ ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ 2022/05 ට අනුව වත්කම් වර්ගීකරණය කර ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ. (ඇමුණුම 01)
02.	2017.06.26 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මේ වන විට 2026 වර්ෂයේ පළමු කාර්තුවේ මිලදී ගත් වත්කම් සහ අපහරණය කළ වත්කම් පිළිබඳ කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 02)
03.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	අතිරික්ත භාණ්ඩ තොග පොත් වලට ගැනීමට උපදෙස් දී ඇත. ඌණතා භාණ්ඩ පිළිබඳ නැවත පරීක්ෂා කර වර්තමාන තත්ත්වය වාර්තා කරන ලෙස ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත. (ඇමුණුම 03)
04.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු වාහන වලට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන අතර, ඉදිරියේදී මෙම වාර්තා මාසිකව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
05.	සෑම වාහනයක් සඳහාම ලොග් පොත් යාවත්කාලීන පදනමක් මත පවත්වා නොතිබුණි.	මේ වන විට ලොග් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
06.	මු.රේ. 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි.	මේ වන විට වර්ෂයේ වෙන් කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ බැරකම්වලට එළඹෙනු ලැබේ.
07	මු.රේ.371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි.	මේ වන විට තත්ත්කාර්ය අතුරු අග්‍රිම මාසයක් ගතවීමට පෙර නිරවුල් කරනු ලැබේ.

දෙවැනි කොටස :39.00

01.	ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	දැනට පවතින වෙබ් අඩවිය මේ වන විට යාවත්කාලීන කරමින් එහි පැවති දුර්වලතා මගහරවා ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. එහිදී මහජනතාවට පැමිණිලි හෝ ප්‍රශංසා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.
02.	ආයතනය තම විෂයය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	මේ වන විට තිරසර අරමුණු හඳුනාගෙන එම අරමුණු ඉටුකර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්කද ඒ සඳහා දර්ශකද තීරණය කර ඇත. (ඇමුණුම 04)
03.	2008.01.24 දිනැති අංක 05/2018 (1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක	මේ වන විට පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස් කරමින් පවතී.

	05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	
04.	2008 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්යය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි.	මේ වන විට වාර්ෂිකව මානව සම්පත් සැලැස්ම සකස් කර ඒ අනුව කාර්යය මණ්ඩලය සඳහා පුහුණු වීම් ලබා දෙමින් පවතී. (ඇමුණුම 05)
05.	සමස්ථ කාර්යය මණ්ඩලයට ඇතුළත්ව කාර්යය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමටද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	ඉදිරියේදී ගිවිසුම්ගත වීම සඳහා කටයුතු කරනු ලැබේ. කොමසාරිස් ජනරාල් හැරුණු විට මෙම විෂයට අදාළ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙපාර්තමේන්තුවේ නොමැත. පරිපාලන නිලධාරිනියක පමණක් සිටියි. අමාත්‍යාංශයෙන් නියෝජ්‍ය කොමසාරිස්වරයකු (රාජකාරී ආවරණ) පත්කර ඇති බැවින් මානව සම්පත් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නියෝජ්‍ය කොමසාරිස් (රාජකාරී ආවරණ) පත් කිරීමට කටයුතු කරන ලදි.
06.	සැලසුම් ගත පුහුණු අවස්ථා වලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50% ට වඩා අඩු මට්ටමක පැවතුණි.	මෙම කාලය තුළ රටෙහි පැවති කොරෝනා වසංගත තත්ත්වය මත වියදම් සීමා කිරීම හේතුවෙන් කාර්යය මණ්ඩල පුහුණුවීම්ද සැලසුම් කර ඇති පරිදි ඉටු කර ගත නොහැකි වී ඇත. එහෙත් මේ වන විට පුහුණු සැලසුම් අනුව අදාළ පුහුණුවීම් සිදුකර ඇත. (ඇමුණුම 06)
07.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ විය.	**2025** වර්ෂය සඳහා යටත්ව මට්ටමේ මතයක් (තත්ත්වාගණනය කළ විගණන මතයක්) ලබා දී ඇත. එයට හේතුව වත්කම් නිවැරදිව ගිණුම් ගත නොවීම වේ. එනම් දෙපාර්තමේන්තුවේ බුක්තියට ලබා දී ඇති ඉඩම් ගිණුම්ගත වීමත් අයිතිය පවරා ගත් ඉඩම් ගිණුම් ගත නොවීමත් වේ. මේ වන විට එම වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීම සිදු කරමින් පවතී.(ඇමුණුම 07)
08.	2020.08.28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යය භාර්යය පැහැදිළි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යය සාධක දර්ශක 03ක් හඳුනා ගෙන නොතිබුණි.	ඇමුණුම් 04 පරිදි කාර්යය දර්ශක හඳුනාගෙන ඇත.

.....

වෛද්‍ය නලින්ද ජයතිස්ස,

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, "සුවසිරිපාය",
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

Cumulative Non Financial Asset Accounts Report- Central Govt-

Land-9153: 2,338,520,000.00 Table: SA 82
Building- 9151: 1,161,120,185.80 Year: 2023
Machinary-9152: 501,408,303.55 Rpt Date 5/25/2026 11:45:33 AM
WIP-9160: 1,035,539,978.09 Head 220
Intangible-9154: 0.00
Lease-9180: 0.00

Ledger	category	Item	Code	Opn_Bal	Opn_Bal_Add	TransferIn	Purchase	Disposal	Balance
9151	1.1-Dwellings		61111	35,990,000.00	0.00	0.00	0.00	0.00	35,990,000.00
		Circuit Bunglows	****6111108	35,990,000.00	0.00	0.00	0.00	0.00	35,990,000.00
9151	1.2-Non Residential Building		61112	1,125,130,185.80	0.00	0.00	0.00	0.00	1,125,130,185
		Office Building	****6111201	48,454,782.00	0.00	0.00	0.00	0.00	48,454,782.00
		Hospitals	****6111203	760,675,403.80	0.00	0.00	0.00	0.00	760,675,403.8
		Laboratories & Research Stations	****6111209	316,000,000.00	0.00	0.00	0.00	0.00	316,000,000.0
9160	1.4-WIP-Building & Structure		61114	1,035,539,978.09	0.00	0.00	0.00	0.00	1,035,539,978
		WIP-Building & Structure	****611140	21,371,856.74	0.00	0.00	0.00	0.00	21,371,856.74
		Hospitals	****6111410	999,723,994.20	0.00	0.00	0.00	0.00	999,723,994.2
		Hotels & Restaurants	****611145	2,229,467.92	0.00	0.00	0.00	0.00	2,229,467.92
		Office Building	****611148	12,214,659.23	0.00	0.00	0.00	0.00	12,214,659.23
9152	2.1-Transport Equipment		61121	93,944,999.00	0.00	0.00	0.00	0.00	93,944,999.00
		Passenger vehicle	****6112101	79,720,000.00	0.00	0.00	0.00	0.00	79,720,000.00
		Cargo vechicle	****6112102	4,000,000.00	0.00	0.00	0.00	0.00	4,000,000.00
		Agricultural vehicle	****6112103	225,000.00	0.00	0.00	0.00	0.00	225,000.00
		Ambulance	****6112105	9,999,999.00	0.00	0.00	0.00	0.00	9,999,999.00
9152	2.2-Other Machinary & Equipment		61122	386,246,479.55	20,996,825.00	0.00	220,000.00	0.00	407,463,304.5
		Office Equipment	****6112201	75,972,549.62	477,100.00	0.00	220,000.00	0.00	76,669,649.62
		Computer Equipment	****6112202	5,881,397.00	20,283,575.00	0.00	0.00	0.00	26,164,972.00
		Electrical Equipment	****6112203	14,856,444.05	63,650.00	0.00	0.00	0.00	14,920,094.05
		Communication Equipment	****6112204	9,950.00	0.00	0.00	0.00	0.00	9,950.00
		Furniture	****6112205	16,282,441.41	18,500.00	0.00	0.00	0.00	16,300,941.41
		Medical Equipment	****6112207	273,099,262.58	140,500.00	0.00	0.00	0.00	273,239,762.5
		Industrial & Manufacturing Equipment	****6112212	99,744.89	2,000.00	0.00	0.00	0.00	101,744.89
		Agricultural & Dairy Farm Equipment	****6112216	44,690.00	11,500.00	0.00	0.00	0.00	56,190.00
9153	4.1-Land		61410	2,338,520,000.00	0.00	0.00	0.00	0.00	2,338,520,000
		Land	****614100	2,338,520,000.00	0.00	0.00	0.00	0.00	2,338,520,000

REMARKS
This is a computer-generated document. No signature is required.

Plant, Machinery & Equipment

Basic Information

(1) Name of the organisation : Department of Ayurveda

(2) No of Machines owned

	Assets Code as per annexure VIII	*(ii) Name of the plant, machinery and equipment	*(iv) Serial No.	Make	Year of Purchase	Purchased Price (Rs)	In use / Not in use
01	220-BOC-10-P2602/219/1-6112201.331-1	Multimedia Projector	ACER-P-J-X1226AH	ACER	2026	164,799.00	Use
03	220-BOC-10-P2602/219/1-6112201.331-2	Multimedia Projector	ACER-P-J-X1226AH	ACER	2026	164,799.00	Use
05	220-BOC-02-P2602/264/1-6112207.495-1	Burettes Mohr Glass 50.0.1 ml			2026	42,232.20	Use
07	220-BOC-02-P2602/264/1-6112207.495-2	Burettes Mohr Glass 50.0.1 ml			2026	42,232.20	Use
09	220-BOC-02-P2602/264/1-6112207.496-1	Grad Pipettes Grad 25.0.1 ml			2026	2,549.98	Use
11	220-BOC-02-P2602/264/1-6112207.496-2	Grad Pipettes Grad 25.0.1 ml			2026	2,549.98	Use
13	220-BOC-02-P2602/264/1-6112207.497-1	Graduated Cylinders Class 50.1ml			2026	58,037.12	Use
15	220-BOC-02-P2602/264/1-6112207.498-1	Graduated Cylinders Class 25.0.5 ml			2026	60,110.38	Use
17	220-BOC-02-P2602/264/1-6112207.499-1	Beakers low shape 100 ml			2026	855.50	Use
19	220-BOC-02-P2602/264/1-6112207.499-2	Beakers low shape 100 ml			2026	855.50	Use
21	220-BOC-02-P2602/264/1-6112207.499-3	Beakers low shape 100 ml			2026	855.50	Use
23	220-BOC-02-P2602/264/1-6112207.499-4	Beakers low shape 100 ml			2026	855.50	Use
25	220-BOC-02-P2602/264/1-6112207.500-1	Specific Gravity bottles 10 ml			2026	28,396.70	Use
27	220-BOC-02-P2602/264/1-6112207.500-2	Specific Gravity bottles 10 ml			2026	28,396.70	Use
29	220-BOC-02-P2602/264/1-6112207.501-1	Loops for Needle Holders			2026	4,456.86	Use
31	220-BOC-02-P2602/264/1-6112207.501-2	Loops for Needle Holders			2026	4,456.86	Use
33	220-BOC-02-P2602/264/1-6112207.501-3	Loops for Needle Holders			2026	4,456.86	Use
35	220-BOC-02-P2602/264/1-6112207.501-4	Loops for Needle Holders			2026	4,456.86	Use
37	220-BOC-02-P2602/264/1-6112207.501-5	Loops for Needle Holders			2026	4,456.86	Use
39	220-BOC-10-P2603/133/1-6112201.84-39	Ceiling Fan			2026	20,616.47	Use
40	220-BOC-10-P2603/133/1-6112201.84-40	Ceiling Fan			2026	20,616.47	Use
41	220-BOC-10-P2603/133/1-6112201.84-41	Ceiling Fan			2026	20,616.47	Use
42	220-BOC-10-P2603/133/1-6112201.84-42	Ceiling Fan			2026	20,616.47	Use
43	220-BOC-10-P2603/133/1-6112201.84-43	Ceiling Fan			2026	20,616.47	Use
44	220-BOC-10-P2603/133/1-6112201.84-44	Ceiling Fan			2026	20,616.47	Use

45	220-BOC-10-P2603/133/1-6112201.84-45	Ceiling Fan			2026	20,616.47	Use
46	220-BOC-10-P2603/133/1-6112201.84-46	Ceiling Fan			2026	20,616.47	Use
47	220-BOC-10-P2603/133/1-6112201.84-47	Ceiling Fan			2026	20,616.47	Use
48	220-BOC-10-P2603/133/1-6112201.84-48	Ceiling Fan			2026	20,616.47	Use
49	220-BOC-10-P2603/133/1-6112201.84-49	Ceiling Fan			2026	20,616.47	Use
50	220-BOC-10-P2603/133/1-6112201.84-50	Ceiling Fan			2026	20,616.47	Use
51	220-BOC-10-P2603/133/1-6112201.84-51	Ceiling Fan			2026	20,616.47	Use
52	220-BOC-10-P2603/133/1-6112201.84-52	Ceiling Fan			2026	20,616.47	Use
53	220-BOC-10-P2603/133/1-6112201.84-53	Ceiling Fan			2026	20,616.56	Use
						929,056.70	

ඇමුණුම 1

...V/A-C/11/01-2022

2023.09.

...ායතන ප්‍රධානීන් වෙත,

...ණ්ඩ සමීක්ෂණය 2022

...ර්ෂ වසරට අදාළව අවසන් කරන ලද වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයට අනුව අපහරණයට නිර්දේශිත වූ ...පෝරු හා පාරිභෝගික භාණ්ඩ සම්බන්ධයෙන් වන කටයුතු කඩිනමින් අවසන් කර වාර්තා ඉදිරිපත් ...ම්ය, ඌනතා අතිරික්තතා සම්බන්ධයෙන් වන හේතු කඩිනමින් ඉදිරිපත් කරන ලෙසත් මාගේ ...2023.02.17, 2023.04.25, 2023.06.26 හා 2023.08.04 දිනැති ලිපි වලින් ඔබව දැනුවත් කර ඇත.

...ඔබෙන් 2022 වසරට අදාළව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයෙන් අලෙවි කළ යුතු භාණ්ඩ ...), විනාශ කළ යුතු භාණ්ඩ (D-Destroy), අලුත්වැඩියා කළ යුතු භාණ්ඩ (R-Repair) හා මාරු ...යුතු භාණ්ඩ (T - Transfer) සම්බන්ධයෙන් වන කටයුතු **"මු.රෙ. 771 අනුව පොත් වලින් අස් ...ම"** යන මැයෙන් මා විසින් එවන ලද ලිපියේ සඳහන් ආකාරයට සිදු කර එම භාණ්ඩ තොග හා ගබඩා ...ලේඛණ වලින් ඉවත් කිරීමට කටයුතු කර **2023.09.30** දිනට පෙර අදාළ වාර්තා මා වෙත යොමු කිරීමට ...කටයුතු සිදු කරන ලෙස කාරුණිකව දන්වමි.

...වද හා.හා.ග.ප. 66 හි අතිරික්ත ලෙස දක්වා ඇති භාණ්ඩ නිසි පරිදි ඉන්වෙන්ට්‍රිගත කිරීමට කටයුතු ...යුතු අතර, ඌනතා ලෙස දක්වා ඇති අයිතම භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් නොකිරීමට හේතු හා ඒ ...හා යම් නිලධාරියෙකු වගකිව යුතු වේ නම් එසේ වීමට බලපාන ලද හේතු සහිත වාර්තාව ද **2023.09.30** දිනට පෙර ලබා දෙන ලෙස කාරුණිකව දන්වමි.

...ඔබ රෝහලේ/ආයතනයේ කටයුතු ප්‍රමාද වීම පිළිබඳව කළමනාකරණ විගණන රැස්වීමට හා අවශ්‍ය ...හොත් පාර්ලිමේන්තු ගිණුම්කාරක සභාවට කරුණු දැක්වීමට සිදු වුවහොත් ආයතන ප්‍රධානී වශයෙන් ...ඒ සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම් කිරීමට සිදුවන බව මෙයින් වැඩිදුරටත් දන්වා සිටිමි.

...2023 වසරට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට කාලය ද එළඹී ඇති බැවින් 2022 වර්ෂයේ ...ණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඉහත පරිදි වාර්තා කඩිනමින් එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

(භාණ්ඩ අපහරණ වාර්තා හා ඌනතා අතිරික්තතා සම්බන්ධව හේතු ඉදිරිපත් කර ඇති ආයතනවලට මෙය අදාළ නොවන බව කාරුණිකව දන්වමි)

...ම.එම.කේ. අබේසිංහ
...ධාන ගණකාධිකාරී

අත්/කළේ: ආචාර්ය එම්.ඩී.ජේ. අබේගුණවර්ධන
ආයුර්වේද කොමසාරිස්

...පත : අභ්‍යන්තර විගණක - කරු.දැ.ගැ.ස.

45	220-BOC-10-P2603/133/1-6112201.84-45	Ceiling Fan		
46	220-BOC-10-P2603/133/1-6112201.84-46	Ceiling Fan		
			2026	20,616.47
			2026	20,616.47

Use
Use

යහපත් සෞඛ්‍ය හා යහපැවැත්ම SDG 03

අරමුණ	KPI - දර්ශකය	මනින ආකාරය	ඉලක්කය
සේවා ප්‍රවේශය වැඩි කිරීම	ආයුර්වේද රෝහල්වලින් පුහුණුව ලැබූ වෛද්‍ය සිසුන් සංඛ්‍යාව	මාසික,වාර්ෂික වාර්තා	400 2026.12.31 දිනට
	ආයුර්වේද පර්යේෂණ රෝහල් මඟින් සිදුකරන ලද පර්යේෂණ සංඛ්‍යාව	පර්යේෂණ සංඛ්‍යාව	5 2026.12.31 දිනට
	ප්‍රතිකාර ලැබූ සමස්ථ රෝගීන් සංඛ්‍යාව	රෝගීන් සංඛ්‍යාව	සේවා සැපයීම පෙර වසරට වඩා 05% වර්ධනයක් 2026.12.31 දිනට
	පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහන් සංඛ්‍යාව	වැඩසටහන් 12 2026.12.31 දිනට
	ජංගම සායන සංඛ්‍යාව	ජංගම සායන සංඛ්‍යාව	ජංගම සායන 12 2026.12.31 දිනට
රෝග වැලැක්වීම සහ ප්‍රවර්ධනය	පාසල්, ආයතන, ගම්මානවල පැවැත්වුණු ආයුර්වේද සෞඛ්‍ය වැඩසටහන් ගණන	වැඩසටහන් සංඛ්‍යාව හා සහභාගි සංඛ්‍යාව	වැඩසටහන් 50 2026.12.31 දිනට
සේවා ගුණාත්මකබාවය	රෝගී තෘප්තී අනුපාතය	ප්‍රතිපෝෂන පත්‍රිකා	95% + තෘප්තිමත්භාවය 2026.12.31 දිනට
	ගුණාත්මක ඖෂධ නිෂ්පාදන ප්‍රතිශතය	QC වාර්තා	100% ප්‍රමිතිය

			2026.12.31 දිනට
	වෛද්‍යවරුන් ඇතුළුව කාර්යමණ්ඩල පුහුණු වැඩසයහන් ගණන	පුහුණු වැඩසයහන් ගණන	පුහුණු වැඩසයහන් 12 2026.12.31 දිනට
යටිතල හා සම්පත් ක්‌ලමණාකරණය	ආයුර්වේද රෝහල් හා ආයතන නවීකරණය කරන ලද සංඛ්‍යාව	ව්‍යාපෘති සංඛ්‍යාව	ව්‍යාපෘති 21 2026.12.31 දිනට
	අයවැය ප්‍රතිපාදන නිසි පරිදි භාවිතාකරන ලද ප්‍රතිශතය	වියදම් වාර්තා	95% + 2026.12.31 දිනට
	ඖෂධ පැලැටි හා වගාකරන ලද ඉඩම් ප්‍රමාණය	වගාකරන ලද ඉඩම් ප්‍රමාණය හා පැළ ප්‍රමාණය	20% වැඩිකිරීම 2026.12.31 දිනට

සුනිසි මෙහෙවර හා ආර්ථික වර්ධනය - SDG 08

අරමුණ	KPI - දර්ශකය	මනින ආකාරය	ඉලක්කය
ව්‍යවසායකක්ව සහ මධ්‍යම හා කුඩා පරිමාන කර්මාන්ත සංවර්ධනය	1.දේශීයව නිෂ්පාදනය කරන ලද ඖෂධ ප්‍රමාණය	වසරකට නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය (KG / L)	පෙර වසරට වඩා 10 % කින් වර්ධනය 2026.12.31 දිනට
	2 ආයුර්වවේද ඖෂධ වගාවෙන් ආදායම් ලබන ගොවීන් ගණන	ගොවීන් සංඛ්‍යාව	ගොවීන් 100 2026.12.31 දිනට
	ආයුර්වේදය ආශ්‍රිත ව්‍යවසායකයින් සඳහා ලබාදුන් පුහුණු ගණන	පුහුණු සංඛ්‍යාව	පුහුණු 5 2026.12.31 දිනට
	ආයුර්වේද ක්ෂේත්‍රය ආශිත නිර්මාණය වූ නව රැකියා ගණන	රැකියා සංඛ්‍යාව	100 2026.12.31 දිනට

[redacted]	[redacted]	[redacted]	2026.12.31 දිනට
තිරසර සංචාරක ව්‍යාපාරය සංවර්ධනය	[redacted] පැමිණි විදේශිකයින් ගණන	ගෙවීම් දායකයින් සංඛ්‍යාව	100,000 2026.12.31 දිනට
	ආයුර්වේද සෞඛ්‍ය සංචාරක / සුවතා සංචාර මධ්‍යස්ථාන ප්‍රමාණය	මධ්‍යස්ථාන සංඛ්‍යාව	10 2026.12.31 දිනට
	සෞඛ්‍ය සංචාරක ආදායම	සංචාරකයින් සංඛ්‍යාව	වසරකට ආදායම රු.මී. 100 2026.12.31 දිනට

ගොඩබිමේ ජීවිතය - SDG 15

අරමුණ	KPI - දර්ශකය	මනින ආකාරය	ඉලක්කය
ජෛව විවිධත්වය සංරක්ෂණය	සංරක්ෂණය කල වඳවීමේ තර්ජනයට ලක් වූ ඖෂධ පැලැටි ගණන	සංරක්ෂණය කල විශේෂ ගණන	5 2026.12.31 දිනට
	සංවර්ධනය කල ඖෂධ උද්‍යාන සහ බීජ බැංකු ගණන	සංඛ්‍යාව	5 2026.12.31 දිනට
	පාසල් / රාජ්‍ය ආයතන / ප්‍රජාව සමඟ පැවැත්වූ සංරක්ෂණය සහ ව්‍යාප්ති සේවා වැඩසටහන් ගණන	සංඛ්‍යාව	100 2026.12.31 දිනට
ජානමය සම්පත් සාධාරණව බෙදා හැරීම	දේශීය දැනුම ලේඛණගතකල ප්‍රමාණය	සංඛ්‍යාව	5 2026.12.31 දිනට

(අමුණුම 0

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2026 වර්ෂය සඳහා වන

මානව සම්පත් සංවර්ධන සැලැස්ම

1. සංවිධානය :

1.1 අමාත්‍යාංශය : සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
1.2 දෙපාර්තමේන්තුව : ආයුර්වේද දෙපාර්තමේන්තුව

2. සංවිධානයේ සැකැස්ම :

2.1 දැක්ම : ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රම මඟින් සැමට සුවසෙත

2.2 මෙහෙවර : ආයුර්වේද හා පාරම්පරික දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණ, සංවර්ධනය හා අනන්‍යතාව සුරක්ෂිත කිරීම තුලින් සැමට සුවසෙත ළඟාකරදීම, ජාතික මට්ටමින් වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

2.3 අරමුණු:

2.3.1 ආයුර්වේදයට අනුව මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම, වර්ධනය කිරීම හා රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා සේවාවන් හා ආයතන සැපයීම.

2.3.2 ආයුර්වේදයට අනුව රෝග පරීක්ෂා කිරීම හා මහජන සෞඛ්‍ය දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු යෙදීම, දියුණු කිරීම හා ඊට ධෛර්යය ලබා දීම.

2.3.3 දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත හෝ සේවයේ යෙදීමට යෝජිත තැනැත්තන්හට ශිෂ්‍යත්ව හා පහසුකම් සැපයීමෙන් ආයුර්වේද අධ්‍යාපන හෝ පර්යේෂණ කටයුතුවල යෙදෙන ආයතනවලට ආධාර ප්‍රදානය කිරීම හා ධෛර්ය ලබා දීම.

3. ආයතනයේ මානව සම්පත :

3.1 පවත්නා මානව සම්පත් ගැටළු (පවත්නා තත්වය)	3.2 අපේක්ෂිත මානව සම්පත් අභියෝග (අනාගතවාදී දැක්මකින් යුතුව)	3.3 අපේක්ෂිත මානව සම්පත් නිපුණතාවයන් (අපේක්ෂිත තත්වය)
දෙපාර්තමේන්තුවේ විෂය පථය අනුව කටයුතු කිරීමට ප්‍රමාණවත් කුසලතා පුර්ණ, තාක්ෂණික දැනුම ඇති කාර්යය මණ්ඩලයක් නොමැති වීම.	නව බඳවා ගැනීම් ලෙස හා ස්ථාන මාරු ලෙස නවක නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත පැමිණීමේදී අවශ්‍යතා ඉටු කිරීමට හැකි වන පරිදි ධාරිතා සංවර්ධනය කිරීම.	දෙපාර්තමේන්තුවේ "දැක්ම" ළඟා කරගැනීම සඳහා අවශ්‍ය වන නවීන තාක්ෂණික දැනුමින් සමන්විත කුසලතාවයෙන් හා ආකල්ප වලින් පිරිපුන් ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ඇති කිරීම.

4. මානව සම්පත් කළමනාකරණ සැලැස්ම

4.1 පුහුණු උපායමාර්ග

අපේක්ෂිත නිපුණතා මට්ටම	පවතින නිපුණතා මට්ටම	අවශ්‍ය පුහුණුව	සැලසුම් කර පුහුණු වැඩසටහන්
දෙපාර්තමේන්තුවේ දැක්ම හා අරමුණු ළඟා කරගැනීම සඳහා අවශ්‍ය වන නවීන තාක්ෂණික දැනුමින් සමන්විත කුසලතාවයෙන් හා ආකල්ප වලින් පිරිපුන් ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් ඇති කිරීම.	මෙම දෙපාර්තමේන්තුවේ සැලකිය යුතු නිලධාරින් ප්‍රමාණයක් නවක නිලධාරින් වන බැවින් මූලික දැනුමක් ලබා දිය යුතු මට්ටමේ පවතී.	කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය ආදී ආයතනික හා පරිපාලන කාර්යයන් සම්බන්ධ පුහුණු වැඩසටහන්	ආයතන සංග්‍රහය
			නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම
			ආයුර්වේද පනත,ආයුර්වේද සංග්‍රහය,සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අදාල නීතිරීති
			කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව
			සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
		කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි හා අනෙකුත් ගිණුම්කරණ කටයුතු හා සම්බන්ධ පුහුණු	ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව
		ධනාත්මක චින්තනය, නායකත්ව පුහුණුව, ආකල්ප වර්ධනය ආදී පෞරුෂත්ව වර්ධන පුහුණුව	ආකල්ප සංවර්ධනය
		රථවාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලනය	රථවාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලනය පිළිබඳ වැඩමුළුව
		තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සම්බන්ධ පුහුණු	පරිගණක ජාලකරණය නවීන මෘදුකාංග,දත්ත විශ්ලේෂණය
			දෙමළ භාෂාව පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම

4.2 මානව සම්පත් කළමනාකරණ වැඩසටහන් ප්‍රමුඛතාකරණය

සැලසුම් කළ පුහුණු වැඩසටහන්	අත්‍යාවශ්‍ය	අවශ්‍ය	අවශ්‍ය නොවන
දෙමළ භාෂාව පිළිබඳ පුහුණුව	√		
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම	√		
ආයුර්වේද පනත, ආයුර්වේද සංග්‍රහය සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අදාල නීති රීති	√		
ආකල්ප සංවර්ධනය	√		
කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරි පුහුණුව		√	
ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව		√	
රථවාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලන පිළිබඳ වැඩමුළුව	√		
සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම		√	
පරිගණක ජාලකරණය, නවීන මෘදුකාංග,දත්ත විශ්ලේෂණ	√		
පරිගණක නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු	√		

5. වසරේ අවසන් පුහුණු සැලැස්ම

5.1 මූලික සැලැස්ම

තෝරා ගත් පුහුණු වැඩසටහන්	ඉලක්කගත කණ්ඩායම	පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ	කාල පරාසය	අපේක්ෂිත නිපුණතා මට්ටම වෙත ළඟා වීම සඳහා වන යාන්ත්‍රණය
දෙමළ භාෂාව පිළිබඳ පුහුණුව	ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධාරී කණ්ඩායම්	නිලධාරීන් සඳහා දෙමළ භාෂා ප්‍රවීනතාවය ලබාදීම	දින 25	දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමග එක්ව පුහුණු වැඩසටහන: පැවැත්වීම
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම	ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධාරී කණ්ඩායම්	නිවාඩු පිළිබඳ අවබෝධය හා වර්ධනය කිරීම තුලින් ආයතනවල හා කළමනාකරණ සහකරුවන්ගේ ඵලදායිතාවය වර්ධනය කිරීම හා ආයතනික කටයුතු නිවැරදිව පවත්වාගෙනයාම	දින 02	ආයතන වෙතින් ලැබෙ පුහුණු වැඩසටහන් සඳ නිලධාරීන් යොමු කිරීම
ආයුර්වේද පනත,ආයුර්වේද සංග්‍රහය සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අදාල නීතිරීති	ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධාරී කණ්ඩායම්	ආයුර්වේද පනත,ආයුර්වේද සංග්‍රහය සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අදාල නීතිරීති පිළිබඳව අවබෝධයක් ලබාගැනීම්	දින 02	දෙපාර්තමේන්තුව විසි දේශීය වෛද්‍යක්‍රම පිළිබ ජාතික ආයතනය සම එක්ව පුහුණු වැඩසටහන: පැවැත්වීම
ආකල්ප සංවර්ධනය	ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධාරී කණ්ඩායම්	යහපත් ආකල්ප වර්ධනය තුලින් ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම	දින 02	දෙපාර්තමේන්තුව විසි දේශීය වෛද්‍ය ක්‍රම පිළිබ ජාතික ආයතනය සම එක්ව පුහුණු වැඩසටහන: පැවැත්වීම
කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව	ප්‍රථමික මට්ටමේ නිලධාරී	කාර්යාල සේවයට අදාල මූලික තොරතුරු පිළිබඳ අවබෝධය,රාජ්‍ය ආයතනයන්හි සංවිධාන ව්‍යුහය හා පිළිපැදිය යුතු වර්යාධර්ම	දින 01	ආයතන වෙතින් ලැබෙ පුහුණු වැඩසටහන් සඳ නිලධාරීන් යොමු කිරීම
ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව	විධායක,ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධාරී කණ්ඩායම්	දෙපාර්තමේන්තුවේ ගිණුම්කරන කටයුතු පිළිබඳ දැනුම ලබාදීම.	දින 02	ආයතන වෙතින් ලැබෙ පුහුණු වැඩසටහන් සඳ නිලධාරීන් යොමු කිරීම

තෝරා ගත් පුහුණු වැඩසටහන්	ඉලක්කගත කණ්ඩායම	පුහුණු වැඩසටහනේ ප්‍රධාන අරමුණ	කාල පරාසය	අපේක්ෂිත නිපුණ මට්ටම වෙත ළඟා සඳහා වන යාන්ත්‍ර
රථවාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලනය පිළිබඳ වැඩමුළුව	ද්විතීයික හා තෘතීයික නිලධාරී කණ්ඩායම්	දෙපාර්තමේන්තුව සතුව ඇති වාහන හා යන්ත්‍රසූත්‍ර නිසි ආකාරයෙන් පවත්වාගෙනයාම පිළිබඳ පුහුණුවක් ලබාගැනීම	දින 01	ආයතන වෙතින් ලැ පුහුණු වැඩසටහන් නිලධාරින් යොමු කිරී
සංවර්ධන - ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	විධායක,ද්විතීයික හා තෘතීයික නිලධාරී කණ්ඩායම්	සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දැනුමක් ලබාගැනීම	දින 01	ආයතන වෙතින් ලැ පුහුණු වැඩසටහන් නිලධාරින් යොමු කිරී
පරිගණක ඡාලකරණය,නවීන මුද්‍රකාංග,දත්ත විශ්ලේෂණ	විධායක,ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධාරී කණ්ඩායම්	දෙපාර්තමේන්තුවේ විවිධ වාර්තා සකස් කිරීම හා අංශයේ කටයුතු වඩාත් හොඳින් සිදුකිරීමේ හැකියාව ලබාදීම	දින 02	ආයතන වෙතින් ලැ පුහුණු වැඩසටහන් නිලධාරින් යොමු කිරී
පරිගණක නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු	විධායක,ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධාරී කණ්ඩායම්	දෙපාර්තමේන්තුවේ කටයුතු - නිසිපරිදි පවත්වාගෙන යාම සඳහා	දින 02	ආයතන වෙතින් ල පුහුණු වැඩසටහන් නිලධාරින් යොමු කිරී

5.2 කාල රාමුව

තෝරා ගත් පුහුණු වැඩසටහන්	1	2	3	4	5	6	7	8	9	10	11	12
දෙමළ භාෂාව පිළිබඳ පුහුණුව		√	√	√	√	√						
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම		√										
ආයුර්වේද පනත,ආයුර්වේද සංග්‍රහය සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අදාල නීති රීති			√	√								
ආකල්ප සංවර්ධනය					√							
කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව						√						
ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව					√							
රථවාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලනය පිළිබඳ වැඩමුළුව					√							
සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම						√						
පරිගණක ජාලකරණය,නවීන මෘදුකාංග,දත්ත විශ්ලේෂණ						√						
පරිගණක නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව								√				

5.3 විෂයමාලා සැලැස්ම

තෝරා ගත් පුහුණු වැඩසටහන්	ප්‍රධාන විෂය ක්ෂේත්‍ර
දෙමළ භාෂාව පිළිබඳ පුහුණුව	ආයතනික කටයුතු
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම	ආයතනික කටයුතු
ආයුර්වේද පනත, ආයුර්වේද සංග්‍රහය සහ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අදාල නීතිරීති	ආයතනික කටයුතු
ආකල්ප සංවර්ධනය	ආයතනික කටයුතු
කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව	ආයතනික කටයුතු
ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව	ගිණුම් කටයුතු
රථවාහන හා යන්ත්‍රසූත්‍ර පරිපාලනය පිළිබඳ වැඩමුළුව	පාලන කටයුතු
සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	ආයතනික කටයුතු
පරිගණක ජාලකරණය,නවීන මෘදුකාංග,දත්ත විශ්ලේෂණය	ආයතනික කටයුතු
පරිගණක නඩත්තු කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	පාලන කටයුතු

6. කාර්ය සාධන කළමනාකරණය

6.1 කාර්යසාධනය ඇගයීම

සේවා ගණය	කාර්යසාධන ඇගයීම් ආකෘතියේ ඇමුණුම් අංකය	කාර්යසාධන ගිවිසුම් ආකෘතියේ ඇමුණුම් අංකය
විධායක	අ ආකෘතිය	ආකෘති 01 (අ)
තෘතීයික	ඒ ආකෘතිය	ආකෘති 01 –(ඇ)
ද්විතීයික	ඒ ආකෘතිය	ආකෘති 01 –(ඇ)
ප්‍රාථමික	ඒ ආකෘතිය	ආකෘති 01 –(ඇ)


6.2 පුහුණුවේ ප්‍රතිඵලය ඇගයීම සඳහා වන යාන්ත්‍රණය

සේවා ගණය	පුහුණුව මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ධනාත්මක / පැහැදිලි නැත / වෙනසක් නැත	ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කරන්නන් අගය කිරීමේ යාන්ත්‍රණය	අඩු කාර්යසාධනයක් පෙන්නුම් කරන්නන් සඳහා වන යාන්ත්‍රණය
විධායක තෘතීයික ද්විතීයික ප්‍රාථමික	පුහුණුව මඟින් අපේක්ෂිත ප්‍රතිඵල ධනාත්මක පැහැදිලි වේ	1. ප්‍රශංසා සහතික ලබාදීම 2. විදේශ පුහුණු අවස්ථාවක් ලබා දීම	1. වැඩිදුර පුහුණු


අංකය	විස්තරය	2023		2024		2025	
		වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගී වූ සංඛ්‍යාව
01	පුහුණු වැඩසටහන්						
	රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් සඳහා						
1.1.1	ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්	09	263	13	466	19	355
1.1.2	ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්	15	544	06	207	15	214
1.1.3	වෛද්‍ය සහායක කාර්ය මණ්ඩලය	10	228	08	310	11	398
1.1.4	අනධ්‍යන කාර්ය මණ්ඩලය	05	204	05	87	04	98
1.1.5	අනෙකුත් රාජ්‍ය සේවකයන්	0	-	1	27	01	20
	සීමාවාසික වෛද්‍ය පුහුණුව						
1.2.1	සීමාවාසික වෛද්‍ය පුහුණුලාභීන්	2022/2023-03	400	2023/2024-02	315	2025/2026-03	356
		2023/24 - 01	250	2024-2025-03	362	2025/2026-02	377
	පාරම්පරික වෛද්‍ය පුහුණුව						
1.3.1	පාරම්පරික වෛද්‍යවරුන්	11	384	10	426	11	351
	පෞද්ගලික පුහුණු පාඨමාලා						
1.4.1	ආයුර්වේද සම්බාහන ශිල්පී (NVQ 4)	01	20	01	20	01	20
02	සෞඛ්‍ය ප්‍රවර්ධනය වැඩසටහන්						
	සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්	01	100	02	170	05	534
එකතුව		**56**	**2393**	**51**	**2390**	**72**	**2723**

වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ 2023, 2024 හා 2025 වර්ෂයන්ට අදාළව සිදු කරන ලද පුහුණු සහ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් පිළිබඳ සංශිප්ත වාර්තාවක් වගු අංක 2 මඟින් දක්වා ඇති අතර 2023 හා වර්ෂයන්ට සාපේක්ෂව 2025 වර්ෂය තුළ වැඩසටහන් වැඩි ප්‍රමාණයක් සිදු කර ඇති අතර පුහුණුලාභීන්ද වැඩි සහභාගී වී ඇත.

ප්‍රස්ථාර අංක 1



ප්‍රස්ථාර අංක 2




2023, 2024 හා 2025 වර්ෂයන්හිදී පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (ප්‍රස්ථාර අංක 1) සහ පුහුණුලාභීන් සංඛ්‍යාව (ප්‍රස්ථාර අංක 2) මගින් තවදුරටත් සංසන්දනාත්මකව දක්වා ඇත.

සුළු වැඩසටහන්:-





















සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්:-














ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } MED/A/AD/01/25/02 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2026 මැයි 07 දි

ආයුර්වේද කොමසාරිස් ජනරාල්
ආයුර්වේද දෙපාර්තමේන්තුව

ශීර්ෂය 220- ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 220- ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ . ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය් සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ආයුර්වේද දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන